**ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2023**

**-----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය, මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත අංක 11 ප්‍රකාරව රජයේ ප්‍රදාන ආදායමට ගත යුතු වුවත් ඉකුත් වර්ෂ වලදී ලැබී 2023දෙසැම්බර් 31දිනට පවතින රු 40,215,607.ක රාජ්‍ය ප්‍රදාන සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී ප්‍රමිතිය අනුව ගිණුම් තැබීමට කටයුතු කරමි. | ප්‍රමිතය ප්‍රකාරව රජයේ ප්‍රදාන ආදායමට ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ඡේදයට පටහැනිව ආයුගණක තක්සේරු ක්‍රමය අනුගමනය නොකර රු 12,859,335.ක පාරිතෝෂිත ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ බැවින් වටිනාකම අධි/ඌණ ගණනය විය හැකිය. | ආයු ගණන තක්සේරු ක්‍රමය අනුව පාරිතෝෂිතය ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමට කටයුතු කරමි. | ප්‍රමිතය ප්‍රකාරව ආයුගණක තක්සේරුව ගණනය කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුළු බඩු අලෙවි මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව ණය පදනමට ලබාගත් රු. 2,777,727 ක භාණ්ඩවලින් රු. 328,647 ක භාණ්ඩ කල් ඉකුත් වී තිබුණද තොග හානිය මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කර නොතිබුණි. | දෙහිවල අලෙවිසැලේ රු. 328,647 ක් වටිනා මෙම තොගය 2023.12.25 දින වන විට විනාශ කර තිබූ නිසා 2023 දෙසැම්බර් 31 දිනට භෞතික තොග ගණන් ගැනීමේ දී මෙම තොගයේ වටිනාකම අවසන් තොගයට නොගැනීම නිසා ලාභය ද නිවැරදිව පෙන්වා ඇතත් ගිණුම් පිළියෙල කිරීමේදී තොග හානි ලෙස පෙන්වා තොගයෙන් අඩුකර නොමැති බව පිළිගනිමි. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරමි. | තොග හානිය මූල්‍ය ප්‍රකාශන වලට ගැළපුම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ ව්‍යාපෘති මෙහෙයුම් ආදායම රු.196,445 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි.<br>2024 වසරේ දී නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වර්ෂයේ ආදායම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු. 1,805,492 ක් වූ ක්‍රමක්ෂය වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනම අයිතමයක් ලෙස නොපෙන්වා පරිවර්තන, සන්නිවේදන, උපයෝගිතා සහ අනෙකුත් සේවා වියදම් වලින් අඩුකර දැක්වීම හේතුවෙන් එම වියදම | සමාලෝචිත ක්‍රමක්ෂය වටිනාකම වියදම් යටතේ අඩුකර ගිණුම් සටහන් 21 යටතේ එම වියදම වෙනම පෙන්වා ඇතත් ඉදිරියේදී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් වලින් අඩු නොකර ආදායම් යටතේ පෙන්වීමට කටයුතු කරමි. | ක්‍රමක්ෂය වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් වලින් අඩුකර |

| | | |
|---|---|---|
| මූලා කාර්ය සාධන ප්‍රකාශයේ එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | නොදැක්විය යුතුය. |

## 1.6 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ මුං ඇට හා උඳු ආනයනය කර බෙදා හැරීමේ ව්‍යාපෘතියක් සඳහා බාහිර පාර්ශවයන් ගෙන් රු. 21,635,000 ක තැන්පතු ලබාගෙන තිබුණද අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර නිරවුල් නොකළ රු.9,515,000 ක මුදල තැන්පත් ගිණුමක රඳවාගෙන තිබුණි. | ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය වෙත මුං ඇට මෙ.ටොන් 2,250 ක් හා උඳු මෙ.ටොන් 1,350 ක් ගෙන්වීමට තිබූ වාරනය ඉවත් කර උඳු හා මුං කිලෝවක් රු.300 ක බදු මුදල් යටතේ ආනයනය කිරීමට 2023/08/17 වන දින ගරු ජනාධිපතිතුමා විසින් අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදි. ඒ අනුව මණ්ඩලයේ මිල කමිටුව විසින් තීරණය කළ ආනයන වියදමින් සියයට 3 ක පරිපාලන ගාස්තුවක් මණ්ඩලයට ලැබෙන බැවින් ඉදිරි කටයුතු සැලසුම් කරන ලදි. නමුත් ඊට අදාල තහනම ආනයන අපනයන පාලක විසින් ඉවත් නොකිරීම නිසා ආනයන කටයුතු සිදු කිරීමට නොහැකි වන ලදි. සමහර සමාගම් ඉල්ලීම් කර ඔවුන්ගේ මුදල් නැවත ලබාගත් අතර අනෙකුත් සමාගම් තවමත් අප බාරයේ එම මුදල් රදවා ඇත. | නිරවුල් නොකළ තැන්පතු මුදල් අදාළ පාර්ශවය වෙත ගෙවීම් කළයුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (අ) මු.රෙ. 104(4) | 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ රු.4,094,596 ක් වටිනා සෝයා බෝංචි අස්ථානගත වීම සම්බන්ධයෙන් හිටපු සභාපති, අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ,(වර්තමානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා) ව්‍යාපෘති නිලධාරි වෙත සාමුහිකව වගකීම් පැවරෙන බව විමර්ශන වාර්තාවේ දන්වා තිබියදීත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට වැටුප් රහිතව විදේශගත වීමට අවසර ලබා දී තිබුණි. | 2018 වර්ෂයේ අනුරාධපුර උපුල්දෙණිය ගබඩාවේ සෝයාබෝංචි කි.ග්‍රෑ 37,223 ක් අස්ථානගත වීම පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූලික පරීක්ෂණයක් පවත්වා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 2023.05.12 දින 91706/03/23 අංක යටතේ නඩු ගොනුකොට තවමත් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී. | වගකිව යුතු පාර්ශවවලින් අලාභය අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) මු.රෙ. 571 (2) | වර්ෂ 02 ක ඉක්මවූ රු. 76,220,010 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ මේ වන විට නෙල්නා ෆාම් පුද්ගලික සමාගම නමින් තිබූ රු.40,214 ක මුදල නිරවුල් කර ඇත.ඩබ්.ටී.ආර්.චන්දන ලාල් ගුණවර්ධන නමින් තබා ඇති රු.10,000 තැන්පතුව බුත්තල කොම්පෝස්ට් ව්‍යාපෘතිය දැනටමත් ක්‍රියාත්මකව පවතින නිසා එම මුදල නිදහස් කළ නොහැක. වැව් ව්‍යාපෘතියට අදාලව රු.76,085,636 ක මුදල ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. අනෙකුත් තැන්පත් නිදහස් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | වැව් ව්‍යාපෘතියට අදාලව තැම්පතු වලින් අදාල වැව ප්‍රතිසංස්කරණ ය කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 59,970,688 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. 16,020,225 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.43,950,463 ක ප්‍රගතියකි. එය පොලී ආදායම රු. 31,041,573 කින් වැඩිවීම හා වෙනත් මෙහෙයුම් ආදායම රු. 33,917,153 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ ප්‍රගතිය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර / අමාත්‍යාංශ ප්‍රදාන සියයට 38 ක අඩුවීමක්ද, වෙනත් මෙහෙයුම් ආදායම් හා පොලී ආදායම් පිළිවෙලින් සියයට 314 හා 119 කින්ද වැඩි වී තිබුණු අතර වෙනත් ආදායම සියයට 88.9 ක අඩුවීමක්ද, සේවක පරිශ්‍රමික වියදම සැපයුම් හා අවශ්‍යතා වියදම් පිළිවෙලින් සියයට 4.1 කින් හා සියයට 5.1 කින් අඩුවී තිබුණි. ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා හා වෙනත් වියදම් හා ස්ථාවර වත්කම් අලුත්වැඩියා නඩත්තු වියදම්ද පිළිවෙලින් සියයට 40.3 හා 82.8 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පනතේ දක්වා ඇති අරමුණක් නොවූ වැව්වල පස් ඉවත් කර අධිවේගී මාර්ගවලට පස් විකිණීමෙන් රු.81,134,631 ක ආදායමක් ලබා තිබුණු අතර වැව් ව්‍යාපෘති වාර්තාවට අනුව සපයන ලද පස් සඳහා අදාළ ගොවි සංවිධානවලින් මණ්ඩලයට මුදල් ලබාගෙන එම මුදල් රජයේ ප්‍රතිපාදනද සමග යොදා කුඩා වැව් නිසි ප්‍රමිතියට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතු බව දක්වා තිබුණත් එසේ නොකර ලැබූ | පිළිගනිමි | නිසි ප්‍රමිතියට අනුව කුඩා වැව් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු උපදේශකත්වය යටතේ සංවර්ධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුදලින් රු.76,085,636 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | | |
| (ආ) | 2022 වර්ෂයේදී තණමල්විල ගොවිපොළෙහි ඇති සාගිනි වැවෙහි කොටසක් ප්‍රතිසංස්කරණය සඳහා රු.500,000 ක අත්තිකාරමක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදී ඇතත් එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවටද මේ සම්බන්ධව විසඳුමක් ලබා දෙන ලෙස දැන්වූ අතර නැවත අලුතෙන් ප්‍රතිසංස්කරය කරන ආකාරය පිළිබඳව වැඩ පිළිවෙලක් ඉදිරියේදී සකස් කරන බව පවසන ලදි. | වැව ප්‍රතිසංස්කරණය කර ගොවිපොලේ වගාවට ජලය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) විසින් 2022 දෙසැම්බර් මාසයේ වැටුප් වවුචර්ය නිර්දේශ කළ යුතු වුවත් හේතුවක් නොදන්වා එලෙස නිර්දේශ නොකිරීම සම්බන්ධයෙන් 2023 පෙබරවාරි 15 දින සිට මෙම නිලධාරිනිය අනිවාර්ය නිවාඩු ගැන්වීම සිදු කර වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද මූලික විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) සම්බන්ධව මූලික විමර්ශන වාර්තාව අනුව නිදහසට කරුණු විමසීමේ ලිපියට පිළිතුර ලෙස ඇය විසින් ලිපි දෙකක් එවා ඇති අතර එයින් ඇය විමර්ශන වාර්තාවේ පිටපතක් සහ විමර්ශනයට අදාළ තොරතුරු ඉල්ලා තිබුණි. | මූලික විමර්ශනය කඩිනමින් අවසන් කර ගැටළුව නිරාකරණය කළ යුතුය. |
| (ඈ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අළුත් කරමැටිය වැව ප්‍රතිසංස්කරණයට 2017 සැප්තැම්බර් 25 දින ශ්‍රම ශක්තිය ගොවි සංවිධානය විසින් රු.1,693,200 ක තැන්පත් මුදලක් මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර මුළු පස් කියුබ් ප්‍රමාණයම ඉවත් කර නොගැනීම නිසා රු.1,594,480 ක මුදලක් කිසිඳු ප්‍රමාණවත් සාක්ෂියක් නොමැතිව අදාළ ගොවි සංවිධානයට නොගෙවා 2023 මාර්තු 13 දින ඒ.ආර්.සී.ප්‍රදීප් නැමති පුද්ගලයෙකුට ගෙවා තිබුණි. | කරමැටිය වැව ගොවි සංවිධානය විසින් තැන්පත් කළ මුදලින් වැවට අදාළ ව ඉවත් කළ පස් ප්‍රමාණය හැර ගොවිජන සංවර්ධන කොමසාරිස් ගේ තහවුරුව අනුව ඉවත් කල පස් කියුබ් 3000 ට අදාළ මුදල් රඳවා ගෙන ශ්‍රමශක්ති ගොවි සංවිධානය විසින් එම කාර්යය සඳහා මුදල් තැන්පත් කළ පුද්ගලයා වන ඒ.ආර්.සී ප්‍රදීප්ට ගෙවන ලෙස එම ගොවි සංවිධානයේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික විසින් ලිඛිතව මුද්‍රාව තබා හැඳුනුම්පත් වල පිටපත් ද සමඟ තහවුරු කර මණ්ඩලය වෙත දන්වා ඒ අනුව රු.1594,480 ක් ගෙවා ඇත. එමෙන්ම ඊට අදාළව කෘෂිකර්ම පර්යේෂණ නිලධාරිනිය විසින්ද ඒ බව තහවුරු කර තිබුණි. ගොවි සංවිධාන වලට මෙම කාර්යයන් සිදු කරගෙන යාමට මුදල් නොමැති බැවින් එම ප්‍රදේශයේ සොයාගන්නා සම්පත් දායකයා එම වැව් හැරීමේ කටයුත්ත සඳහා මුදල් තැන්පත් කිරීම හා එම කාර්යය සිදු කල බව මණ්ඩලයේ ව්‍යාපෘති අංශයේ නිලධාරීන්ද දන්නා කරුණකි. | තැන්පත් මුදල් අදාල පාර්ශවයන්ට පමණක් ගෙවීම් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර 16 ක වු රජයේ බලපත්‍රලාභී තණමල්විල ඉඩමෙහි පිහිටි වැව ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා යෝජිත වගා | පිළිගනිමි. තණමල්විල ගොවිපළේ මෙම ගොඩනැගිල්ලේ දැනට ගොම පොහොර | ගොඩනැගිලි ඵලදායීව යොදා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතීන් සිදු කිරීමට හා ගොවිපල ඵලදායීව යොදා ගැනීමට නොහැකිවී තිබුණි. 2020 වර්ෂයේදි එම භූමියේ රු 600,000 .ක් වැයකර ඉදිකර ඇති කාබනික පොහොර සැකසීමේ ගොඩනැගිල්ලද කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතිණි. | නිෂ්පාදනය කර ඒවා දෙහිවල සහ නාරාහේන්පිට පැල තවාන වෙත මෙම ගොම නිෂ්පාදන ලීටර 2 සහ ලීටර 5ක් අලෙවිය සදහා ඒවා ඇත. එම නිෂ්පාදන සදහා ඉහළ පාරිභෝගික ඉල්ලුමක් පවතී. | |
| (ආ) | අක්කර 10 ක් වු රජයේ බලපත්‍රලාභී බුත්තල ඉඩමෙහි කිසිදු කටයුත්තක් නොකර නිශ්කාර්යව පැවති අතර 2021 අප්‍රේල් 05 දින සිට මණ්ඩලයේ නාමය භාවිත කරමින් ගිවිසුම් රහිතව පෞද්ගලික පාර්ශවයක් විසින් බඳුන් මිශ්‍රණ නිෂ්පාදනය කර බෙදාහැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. | පිළිගනිමි.<br>පොදු කාර්යය පිරිවැයෙන් වැඩි ප්‍රතිශතයක් එම සේවකයාගේ වැටුප් හා වේතන සඳහා වැයවී ඇතත් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ අධීක්ෂණය සහ ආරක්ෂාව තුළ බදුන් මිශ්‍රණය සිදුකර නාරාහේන්පිට සහ දෙහිවල පැල අලෙවිසැල් වෙත අලෙවිය සඳහා බෙදාහරිනු ලබයි. | ගොවි පොළ ඵලදායීව යොදා ගත යුතුය. |
| (ඇ) | කලංකුට්ටිය සහල් සැකසුම් මධ්‍යස්ථානයේ පවතින යන්ත්‍ර ධාරිතාවය පැයට වී කිලෝ 1,000 -1,200 ක් පමණ සහල් බවට පත් කළ හැකි වුවත් සමාලෝචිත වර්ෂයේ දී වී කි.ග්‍රෑම් 28,580 ක් පමණක් සහල් බවට පත්කර තිබුණි. මෙම ඒකකයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍ර 06 ක් සහ සහල් පිටි නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍ර 05 ක් 2022 වර්ෂයේ සිට නිෂ්කාර්යයව පැවති අතර යන්ත්‍ර නවීකරණය කිරීමක් මේ දක්වා සිදු වී නොතිබුණි. | කලංකුට්ටිය සහල් සැකසුම් මධ්‍යස්ථානයේ නිෂ්පාදන අලෙවිය දෙහිවල අලෙවිසැලෙන් පමණක් සිදුවීමත්, බාහිර ආයතන හෝ මණ්ඩලයේ ලියාපදිංචි නියෝජිත ආයතන මගින් ලැබෙන ඇණවුම් සීමාසහිත වීමත් නිසා විශාල වශයෙන් වී මිලදී ගැනීම සිදු නොකරන ලදි. තවද, එම සැකසුම් මධ්‍යස්ථානය තුල ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන්නේ සාම්ප්‍රදායික වී සහල් බවට පත්කිරීම වන අතර ඉල්ලුමට සරිලන පරිදි මිලදී ගැනීමට සාම්ප්‍රදායික වී තොග නොමැති වීමද නිෂ්පාදනය අඩුවීමට හේතු විය. | සම්පත් උපරිම ලෙස ප්‍රයෝජන ලැබෙන පරිදි සැලසුම් කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලය විසින් සත්ව ආහාර නිෂ්පාදන සඳහා බඩඉරිඟු ආනයනය කැබිනට් මණ්ඩලයේ හා ආහාර ප්‍රතිපත්ති කමිටුවේ අනුමැතිය නොමැතිව පෞද්ගලික ආනයනකරුවෙකු හරහා සිදුකර තිබූ අතර එම ආනයනයන් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) හි ප්‍රකාරව ප්‍රසම්පාදන දැන්වීමක් අවම වශයෙන් ජාතික පුවත්පතක, ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයක වෙබ් අඩවියෙන්ද, වෙනත් අදාළ වෙබ් අඩවියක හෝ පලකර නොතිබුණි. 2023 වර්ෂයේ මණ්ඩලයට ලැබී තිබුණු ආනයන බලපත්‍රය යටතේ පුද්ගලික සමාගම් දෙකක් විසින් ගෙන්වන ලද කිලෝ ග්‍රෑම් 8,484,036ක් වූ බඩඉරිඟු මණ්ඩලයේ මැදිහත් වීමකින් තොරව විකුණුම් සිදුකර තිබුණි. | මුදල් අමාත්‍යාංශය මඟින් ආහාර ප්‍රතිපත්ති කමිටුවේ නිර්දේශයට 2023 වසර සඳහා අවශ්‍ය බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන තිබුණි. ඒ අනුව බඩඉරිඟු මෙ.ටොන් 200,000 ක් ආනයනයට අවසරය ලබා තිබුණි. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කෘෂිකර්ම ලේකම්තුමා වෙත බඩඉරිඟු ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබූ Tulip ආයතනය අදාල ආනයන කටයුතු සිදු කළ අතර ඒ සඳහා 24/0449/612/012-1 අමාත්‍ය මණ්ඩල සටහන මඟින් ආයතන 03 ක් යටතේ ආනයනය කිරීම සඳහා අවසර ලබා 2023 වසරේ ආනයන කාලය 2024-03-20 දක්වා වරින් වර දීර්ඝ කල අතර අදාල මුදල් මේ වන විට ලබාගෙන ඇත. | මණ්ඩලයට ලද ආනයන බලපත්‍රය යටතේ ආනයනය විධිමත්ව අධීක්ෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ සිදුකරන ලද ව්‍යාපෘති 13 කින් ව්‍යාපෘති 08 ක රු. 9,095,302 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. | දිගින් දිගටම පාඩු ලබා තිබුණු ඒවායේ අලාභය අවම වන ලෙස කටයුතු සිදු කිරීමට කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.දෙහිවල අලෙවි සැල, සාම්ප්‍රදායික සහල් ව්‍යාපෘතිය, බුත්තල ගොවිපල, තණමල්විල ගොවිපල, ඉඳි ආප්ප පිටි ව්‍යාපෘතිය, ඇග්‍රොෆ්‍රෙෂ් වත්තල, RTS බීම ව්‍යාපෘතිය හා තෝසේ පිටි ව්‍යාපෘතිය අලාභ ලබා ඇත. | අලාභය අවම වන ලෙස කටයුතු කළ යුතුය. |